**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2012**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්,භාවිතයට නොගන්නා වත්කම් සහ භාවිතයෙන් ඉවත් කරන ලද වත්කම් වෙනම හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ලෙස රු.32,530,066 හඳුනාගෙන තිබුණි.

(ආ) එක් එක් හෝටල් පාසල් ශාඛා සඳහා වෙනමම ආදායම් ප්‍රකාශන පිළියෙල කර තිබුණද, ප්‍රධාන කාර්යාලයේ වියදම් හෝටල් පාසැල්වලට විභජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. මෙයට අමතරව,සමුද්‍රා හෝටලයට ඍජු හා වක්‍ර පොදු කාර්ය වියදම් විභාජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) වෙළඳ ණයගැතියන් අතුරින් රු. 9,555,378 ක් වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.5,092,956 ක් වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි.

(ආ) විවිධ ණයහිමියන් අතරින් රු.3,934,242 ක් තථ්‍ය වගකීම් හඳුනා නොගැනීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට නොපියවා පැවතුණි.

(ඇ) කාර්ය මණ්ඩලයට ලබාදී තිබුණු රු.404,851 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පියවා නොතිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයන් ඉදිරියෙන් සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නර නොතිබුණි.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණයගැතියෝ | 14,581,666 | ශේෂ සනාථ කිරිමේ ලිපි |
| ආපනශාලා විකුණුම් | 4,593,426 | විකුණුම් ලියකියවිලි |
| දේපල පිරියත සහ උපකරණ | 572,308,458 | i. භෞතික සත්‍යාක්ෂණ වාර්තා<br>ii.ස්ථාවර වත්කම් ලේඛන |
| විකුණුම් පිරිවැය(සමුද්‍රා හෝටලය) | 6,987,145 | තොග ගැලපුම් විස්තර |
| ලැබිය යුතු තැන්පතු | 2,234,312 | ශේෂ සනාථ කිරිමේ ලිපි |
| වෙනත් ලැබිය යුතු ශේෂ | 1,503,002 | ශේෂ සනාථ කිරිමේ ලිපි |
| ශ්‍රී ලංකා සංචාරක අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය | 61,337,343 | ශේෂය සනාථ කිරිමේ ලිපි |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු ශේෂය | 4,417,949 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය | 6,657,304 | ශේෂය සනාථ කිරීමේ ලිපි |

1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති.රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 14(10) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ කාර්ය සාධනය දක්වමින් කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් පිළියෙළ කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | මාසික කාර්ය සාධන වාර්තා, මෙහෙයුම් ප්‍රකාශන, ප්‍රසම්පාදනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකම ,මානව සම්පත් වාර්තා , ණයගැති, ණය හිමි හා තොග කාල විශ්ලේෂණ සහ චලනය නොවන, සෙමින් චලනය වන සහ අභාවිත තොග පිළිබඳ වාර්තා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9.12 වගන්තිය | සේවකයන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල රීති හා රෙගුලාසි ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පරිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟත්වය සහිතව පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ඇ) මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ආයතනය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

1.2.5 අධිකාරි බලය නොළත් ගනුදෙනු

අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙන්කළ වාහන පහසුකම ලබාගැනීම සඳහා හිමිකම් නොලබන තනතුරු 3ක රාජකාරියේ නියුක්ත නිලධාරීන් තිදෙනෙකුට 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ප්‍රවාහන සහ ඉන්ධන දීමනා වශයෙන් රු. 3,551,640 ක් ගෙවා තිබුණි .

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලින් රු.53,580,403 ක අතිරික්තයක් වූ අතර ,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,649,410 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.2,069,007 කින් පිරිහී තිබුණි. පසුගිය වර්ෂයට වඩා රු.31,411,357 කින් වියදම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය පිරිහීම කෙරෙහි බලපා තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ආදායම රු.මිලියන 294 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 265 සමඟ සැසඳීමේදී සියයට 10.9ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 209 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු. මිලියන 241 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 14.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හෝටල් පාසැල්වල කාර්ය සාධනය

සිසුන් පුහුණු කිරීම (අභ්‍යාන්තර) පිළිබඳ කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ලියාපදිංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 551 ක් හෙවත් සියයට 94 කි. 2011 වර්ෂයේ ලියාපදිංචිවූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 96 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඒක සිසු පිරිවැය රු. 437,005 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.147,242 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව වර්තමාන සංචාරකයන්ගේ පැමිණීම වන මිලියන 1.005 ක ප්‍රමාණය හා සැසඳීමේදී 2016 වන විට සංචාරක පැමිණීම මිලියන 2.5 කින් වර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවත්, ඉහත ඉලක්කයට සමගාමීව කර්මාන්තයේ සමස්ථ අරමුණු ලඟා කරගැනීමට අවශ්‍ය මානව සම්පත් අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් උපායමාර්ග සැළසුම් සකස් කර නොතිබුණි.

3.2 අරමුදල් ඌණ උපයෝජනය

දුර්වල මූල්‍ය කළමණාකරණය හේතුවෙන් රු. මිලියන 99 සිට රු. මිලියන 134 අතර වූ පරාසයක බැංකු සමාලෝචිත වර්ෂය මුළුල්ලේම නිශ්කාර්යව තිබුණි.

3.3 නිෂ්ක්‍රීය වත්කම්

සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 ජනවාරි මාසයේදී මිලට ගත් වටිනාකම රු.11,929,385 ක් වූ හෝටල් උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිෂ්ක්‍රීයව තිබුණි.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

ශාක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන්, පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් හා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, සමුද්‍ර හෝටලයේ කාමර නවීකරණය කර තිබුණි. ඉදිකිරීම් වැඩ පෞද්ගලික සමාගමකට රු. මිලියන 51 ක් වූ ඉදිරිපත් කළ මිල ගණන මත පවරා තිබුණි. නිම කරන ලද ඉදිකිරීම් නිසි ප්‍රමිතියකට නොතිබුණි.

3.5 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ගුණාත්මකභාවය සහ විශ්වාසවන්තභාවය

සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂ දෙක තුළදී පරිගණක හා පරිගණක මෘදුකාංග මිලදී ගැනීම සඳහා රු. මිලියන 30 ක් වැය කර තිබුණද, ආයතනයේ කළමනාකරණ තොරතුරුවල අවශ්‍යතාවය හඳුනාගෙන විධිමත් තොරතුරු පද්ධතියක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

3.6 මානව සම්පත් කළමනාකරණය

සමුද්‍ර හෝටලයේ කාර්ය මණ්ඩලයද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 117 ක් විය. කථිකාචාර්යවරුන් 6 ක් ද ඇතුළත්ව පුරප්පාඩු සංඛ්‍යාව 48 ක් විය. පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

3.7 ප්‍රවාහන ඇණිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාහන 02ක් සඳහා ඉන්ධන,නඩත්තු හා අළුත්වැඩියා වියදම් සඳහා රු.4,142,205 ක් වැය කර තිබුණි. එසේ වුවත්, එම වාහන ධාවනය කළ දුර ප්‍රමාණයන්වල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කුලී පදනම මත යොදාගත් වාහන සඳහා රු.10,532,634 ක මුදලක් වැය කර තිබුණි. තවද කුලියට ගත් වාහන ධාවනය කළ දුර පිළිබඳ අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2012 සිට 2016 වර්ෂය දක්වා ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය හා සම්බන්ධිත මිනිස් බලය සංවර්ධනය, නිෂ්පාදන සංවර්ධන සහ අලෙවිකරණ උපාය මාර්ගයන් වාර්ෂික වැඩසටහන්වලට අනුකූලව ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාලව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

### 4.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් සමඟ තථ්‍ය ආදායම් සහ වියදම් සැසඳීමේදී වැය විෂයන් 28 ක විචලනය, සියයට 52 සිට සියයට 981 දක්වා පරාසයක වී තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
(ආ) අයවැය පාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) අත්තිකාරම් ගෙවීම
(උ) ගිණුම්කරණය